නානාට්ටාන් ප්‍රාදේශිය සභාව

මන්නාරම දිස්ත්‍රික්කය.

-----------------------------------------

1. මූල්‍ය ප්‍රකාශන

---------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරිම.

------------------------------------

සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 මාර්තු 11 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2012 මැයි 05 දින ද විගණනයට ඉදිරිපත් කර තිබුණි. සමාලෝචිත වර්ෂය සඳහා වූ විගණකාධිපති වාර්තාව 2014 ජුනි 05 දින සභාවේ සභාපතිවරයා වෙත නිකුත් කරන ලදි.

1.2 මතය

-------

මාගේ පරික්ෂණයෙන් පෙනීයන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු හා පැහැදිලි කිරිම් අනුව නානාට්ටාන් ප්‍රාදේශිය සභාව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිසි ගිණුම් වාර්තා පවත්වා ඇති බවත් මාගේ වාර්තාවේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශ වලට වන බලපෑම හැර 2012 දෙසැම්බර් 31 දිනට නානාට්ටාන් ප්‍රාදේශිය සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්ම වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.3 ගිණුම් පිළිබඳ අදහස් දැක්විම

---------------------------------

1.3.1 ගිණුම්කරණ අඩුපාඩු

--------------------------

මූල්‍ය ප්‍රකාශන වල නිරික්ෂණය වූ ගිනුම්කරණ අඩුපාඩු පහත ප්‍රකාශයෙහි දැක්වේ.

| මූල්‍ය ප්‍රකාශයන් කෙරෙහි බලපෑම | වත්කම් | | ආදායම් | | වියදම් | |
|---|---|---|---|---|---|---|
| | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. | අවස්ථා සංඛ්‍යාව | වටිනාකම රු. |
| අඩුවෙන් දැක්වීම් | 01 | 6,340 | 02 | 1,981,032 | - | - |
| වැඩියෙන් දැක්වීම් | - | - | - | - | 01 | 23,058 |

1.3.2 විගණනය සඳහා සාක්ෂි නොමැතිවීම

එකතුව රු.4,536,563 ක් වූ ගිණුම් විෂයයන් 03 ක් සඳහා අවශ්‍ය වූ තොරතුරු විගණනයට ලබා නොදීම නිසා එම විෂයයන් විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට නොහැකි විය.

1.3.3 අනුකූල නොවීම්

පහත දැක්වෙන නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

(අ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988, පරිච්ඡේදය,IX - රීති 180 ප්‍රකාරව මුදල් හා ගබඩා භාරව සිටින නිලධාරින් විසින් ඇප තබා නොතිබුණි.

(ආ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988, පරිච්ඡේදය III , රීති 81 ප්‍රකාරව සෑම වර්ෂයකටම එක් එක් කාර්තුව අවසානයේදි මුද්දර ගාස්තු හා උසාවි දඩ මුදල් ලබාගැනීම සඳහා අයදුම්පත් ඉදිරිපත් කර නොතිබුණි.

(ඇ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988 පරිච්ඡේදය V රීති 140 ප්‍රකාරව රු.199,979 ක් වූ අත්තිකාරම් පියවීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ප්‍රාදේශිය සභා මූල්‍ය පාලන හා පරිපාලන රීති - 1988, පරිච්ඡේදය VII, රීති 166 ප්‍රකාරව පොදු ලෙජරයේ සටහන් තැබීම සඳහා ජ'නලයක් පවත්වාගෙන ගොස් නොතිබුණි.

(ඉ) 1990 ඔක්තෝබර් 10 දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය ප්‍රකාරව සභාවට අයත් වාහන 07 කට අදාලව ඉන්ධන දහනය පිළිබඳ පරික්ෂණ සිදුකර නොතිබුණි.

(ඊ) අංක අයිඒඅයි/2002/02 හා 2012 නොවැම්බර් 28 දිනැති භාණ්ඩාගාර ලිපිය ප්‍රකාරව පරිගණක හා උපාංග ලේඛණය පවත්වා නොතිබුණි.

2. මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය

------------------------------------------

2.1 මූල්‍ය ප්‍රතිඵල

----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශ වලට අනුව 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ ආදායම ඉක්මවූ පුනරාවර්ථන වියදම රු.8,340,546 ක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්ථන වියදම ඉක්ම වූ ආදායම රු.1,298,369 ක් විය.

2.2 මූල්‍ය කළමනාකරණය

--------------------------

අයවැයගත සහ තථ්‍ය සංඛ්‍යා අතර ප්‍රමාණාත්මක විචලනයන් නිරික්ෂණය වූයෙන් අයවැය යථාර්ත පදනමක් මත පිළියෙල කර නොමැති බව නිරික්ෂණය විය.

2.3 ආදායම් පරිපාලනය

------------------------

2.3.1 ඇස්තමේන්තුගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම

----------------------------------------------------------------------

සභාව විසින් ඉදිරිපත් කරන ලද තොරතුරු වලට අනුව සමාලෝචිත වර්ෂය සඳහා වූ අයවැයගත ආදායම, තථ්‍ය ආදායම සහ හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | අයවැයගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට හිඟ ආදායම |
|---|---|---|---|
| | රු. | රු. | රු. |
| වරිපනම් හා බදු | 360,000 | 168,050 | - |
| බදු කුලි | 2,825,830 | 1,807,188 | 574,520 |
| බලපත්‍ර ගාස්තු | 414,000 | 298,590 | - |
| වෙනත් ආදායම් | 11,396,340 | 12,302,380 | 103,075 |

2.3.2 මුද්දර ගාස්තු

----------------

රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබිය යුතු රු.5,276,396 ක් වූ මුද්දර ගාස්තු ලබා ගැනිමට කටයුතු කර නොතිබුණි. එනමුත් මුද්දර ගාස්තු නිරවුල් කිරිම සඳහා වූ උපලේඛන රෙජිස්ට්‍රාර් ජනරාල්වරයාගෙන් ලැබි තිබුණි.

2.3.3 උසාවි දඩ මුදල්

-------------------

නොයෙකුත් ආඥා පනත් යටතේ 2012 ඔක්තෝබර් සිට දෙසැම්බර් දක්වා කාලය තුල පනවන ලද රු.359,000 ක් වූ දඩමුදල් මහේස්ත්‍රාත් අධිකරණයෙන් ලබාගෙන නොතිබුණි. මෙම ලැබිය යුතු අධිකරණ දඩ මුදල් ගිණුම්ගතකර නොතිබුණි.

2.3.4 කාර්ය මණ්ඩල ණය අයකර ගැනිම

-------------------------------------------

දීර්ඝ කාලයක් තුල අයනොවි පවතින රු.3,800 ක් වූ කාර්ය මණ්ඩල ණය ශේෂ අයකර ගැනිමට කටයුතු කර නොතිබුණි.

2.4 ණයහිමියන් නිරවුල් නොකිරිම

-----------------------------------

සමාලෝචිත වර්ෂය ආරම්භයේදි පැවති රු.109,146 ක් වූ විවිධ ණය හිමි ශේෂය වර්ෂය අවසානය දක්වාම පියවා නොතිබුණි.

2.5 කොන්ත්‍රාත් පරිපාලනය

----------------------------

යුනිසෙෆ් ආයතනය විසින් ලබාදෙන ලද අරමුදල් යටතේ 2013 ජනවාරි 11 දින ආරම්භ කරන ලද ජල ටැංකියේ ඉදිකිරිම් කටයුතු රු.2,674,185 ක පිරිවැයකින් 2013 මැයි 11 දින නිමකර තිබුණි. එනමුත් 2014 මාර්තු 27 දින වනවිටත් එය ක්‍රියාත්මක කොට මහජන සුභ සිද්ධිය සඳහා යොදවා නොතිබුණි.

2.6 අභ්‍යන්තර විගණනය

----------------------------

සභාවේ කටයුතු සම්බන්ධයෙන් ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් සිදුකර නොතිබුණි.

3. පද්ධති හා පාලන

----------------------

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කෙරේ.

(අ) ආදායම් රැස්කිරීම
(ආ) ස්ථාවර වත්කම්
(ඇ) ගිණුම්කරණය
(ඈ) වාහන උපයෝජනය
(ඉ) අයවැය
(ඊ) පරිත්‍යාග
(උ) මිශ්‍ර තැන්පතු